# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2319/19 - 2023 පෙබරවාරි මස 13 වැනි සඳුදා - 2023.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 1/2012 (V)

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (ඍ) ඡේදය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2023 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2023 මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කළමනාකරණය කිරීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝග මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුතුවල නිරත වන්නා වූ යම් තැනැත්තෙකු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

3. මෙම නියෝග යටතේ තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරය යටතේ හැර කිසිඳු තැනැත්තකු විසින් යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක නිරත නොවිය යුතු ය.

4. කිසිදු තැනැත්තකු විසින් මේ නියෝග යටතේ නිකුත් කරන ලද මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා වන යම් බලපත්‍රයක් වෙනස් කිරීම, විකෘති කිරීම හෝ වංචනික ලෙස භාවිත කිරීම නොකළ යුතු ය.

5. මේ නියෝග යටතේ නිකුත් කරන ලද සියලු බලපත්‍ර සහ සහතික යම් බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී එම නිලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

6. යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක් යටතේ අල්ලා ගනු ලබන යම් වඳ වී යාමේ අනතුරට මුහුණ දී ඇති, තර්ජනයට ලක් වී ඇති හා ආරක්ෂිත මත්ස්‍ය විශේෂ පණ පිටින් මුදා හැරිය යුතු ය.

1A - PG 6214 — 2606 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක නිරතව සිටින යම් තැනැත්තකු විසින්-

(1) හැකිතාක් ඉක්මනින් සජීවී මසුන් මුදා හැරිය යුතු ය;

(2) මසුන් ඇල්ලීම සඳහා, උචිත ප්‍රමාණයේ හා මෝස්තරයේ බිලී කොක්කක් භාවිත කළ යුතු ය;

(3) මසුන් බිලී කොකුවෙන් ගැලවීම සඳහා ජලයෙන් උඩට එසවීමෙන් වැලකිය යුතු ය;

(4) මසුන් හැසිරවීම සඳහා තෙත රෙදි කඩක් හෝ තෙත් වූ දෑත් භාවිත කළ යුතු ය;

(5) මසුන්ට පීඩා හා තුවාල ඇති වීම අවම කිරීම සඳහා මසුන් මෘදු ලෙස හැසිරවිය යුතු ය.

8. කිසිදු තැනැත්තකු විසින් -

(අ) යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක දී අල්ලා ගනු ලබන මසුන් මිලදී ගැනීම, විකිණීම හෝ අපනයනය කිරීම නොකළ යුතු ය;

(ආ) යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක දී අල්ලා ගනු ලබන මසුන් ප්‍රති නැව්ගත නොකළ යුතු ය;

(ඇ) මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා මළ නොබැඳෙන බිලී කොකු භාවිත නොකළ යුතු ය;

(ඈ) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත හා (469 වන අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ තහනම් කරනු ලැබූ මත්ස්‍ය විශේෂ ඇල්ලීම නොකළ යුතු ය;

(ඉ) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ තහනම් කරනු ලැබූ යම් ධීවර මෙහෙයුමක හෝ මේ නියෝගවල අ උපලේඛනයෙහි මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා නියමිත ධීවර මෙහෙයුමක් ලෙස සඳහන් කර නොමැති වෙනත් යම් ධීවර මෙහෙයුමක නිරත නොවිය යුතු ය;

(ඊ) ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද තහනම් කාලසීමාව තුළ හෝ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හෝ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පිළිවෙලින් මසුන් පැටව් දමන හෝ බෝවන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති හෝ සමුද්‍රීය ආරක්ෂිත ප්‍රදේශයක් ලෙස ප්‍රකාශ කරන ලද යම් ප්‍රදේශයක් තුළ යම් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුත්තක නිරත නොවිය යුතු ය;

(උ) අධීක්ෂණයකින් තොරව සිදු කරනු ලබන මසුන් ඇල්ලීමේ කටයුතු සඳහා නියම කරන ලද තාක්ෂණික ක්‍රම භාවිත කරන විට දී හැර ධීවර ආම්පන්න අතහැර නොදැමිය යුතු ය;

(ඌ) මසුන් ජීවග්‍රහණයෙන් මුදා හැරීම සඳහා අවශ්‍ය විට දී භාවිත කිරීම සඳහා යාත්‍රාව තුළ කටු ගලවනයක් සහ රුහැන් කැපුම් උපකරණයක් තබා ඇත්තේ නම් මිස, මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩාවල නිරත නොවිය යුතු ය;

(එ) යම් අපද්‍රව්‍ය, ඉන්ධන, තෙල් වැනි දූෂණ කාරක හෝ යම් රසායනික ද්‍රව්‍යයක් සමුද්‍රයට, කිවුල්දියට, මිරිදියට හා වෙරළාශ්‍රිත ජෛව පද්ධතිවලට නොදැමිය යුතු ය.

9. මේ නියෝග යටතේ යම් බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක් ම මේ නියෝගවල ඉ උපලේඛනයේ සඳහන් "අ ආකෘතියට" සාරානුකූල විය යුතු අතර මේ නියෝගවල ආ උපලේඛනය යටතේ නිශ්චිතව සඳහන් අදාළ බලපත්‍ර ගාස්තුව සමඟ ඒ ඉල්ලීම ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත යවනු ලැබිය යුතු ය.

10. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි ආ උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තුව ගෙවනු ලැබූ විට මේ නියෝගවල ඉ උපලේඛනයේ සඳහන් "ආ" ආකෘතියට සාරානුකූල බලපත්‍රයක් නිකුත් කළ යුතු අතර, එම බලපත්‍රය කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස නිකුත් කරන ලද දින සිට එක් වර්ෂයක කාලසීමාවක් සඳහා බලාත්මකව පැවතිය යුතු ය.

11. යම් බලපත්‍රයක් අලුත් කිරීම සඳහා වන යම් ඉල්ලීමක් එම බලපත්‍රය කල් ඉකුත් වන දිනයට එක් මාසයකට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## I වන කොටස

### *මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා යොදා ගනු ලබන යාත්‍රා ලියාපදිංචි කිරීම*

12. මේ නියෝග යටතේ නිකුත් කරන ලද වලංගු ලියාපදිංචි සහතිකයක් යාත්‍රාවේ නොමැතිව කිසිදු තැනැත්තකු විසින් මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා යම් යාත්‍රාවක් ක්‍රියාත්මක නොකළ යුතු ය.

13. මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩාවල නිරත වන යම් තැනැත්තකු විසින් මේ නියෝග යටතේ වන බලපත්‍රයක් ලබා ගැනීමට පෙරාතුව සෑම යාත්‍රාවක්ම ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

14. ලියාපදිංචි කිරීම සඳහා වන එවැනි සෑම ඉල්ලීමක් ම මේ නියෝගවල ඉ උපලේඛනයේ "ඇ ආකෘතියට" සාරානුකූල විය යුතු අතර මේ නියෝගවල ඈ උපලේඛනයේ නිශ්චිතව සඳහන් අදාළ ලියාපදිංචි ගාස්තුව හා පහත දැක්වෙන ලේඛන සමග ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු යː-

    (1) අදාළ නියමුවා විසින් මේ නියෝගවල ඈ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් පුහුණු පාඨමාලාවක් හදාරන ලද බවට වන සාක්ෂි සමග ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන වලංගු නියමු බලපත්‍රයක්;

    (2) ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙන් හෝ යාත්‍රාවට අදාළව යම් සහතික නිකුත් කිරීම සඳහා වන ලියාපදිංචි වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානයකින් හෝ ලබාගත් මුහුදු යෝග්‍යතා සහතිකයක්;

    (3) යාත්‍රාවේ කාර්ය මණ්ඩලය හා මගීන් සඳහා අත්‍යවශ්‍ය ජීවිතාරක්ෂක සහ ආරක්ෂිත උපකරණවලින් යාත්‍රාව සමන්විත වන බවට සාක්ෂි;

    (4) ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද යම් රක්ෂණ සමාගමකින් ලබා ගන්නා ලද අදාළ යාත්‍රාවේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් හා මගීන් ඇතුළුව එම යාත්‍රාව සඳහා වන පූර්ණ රක්ෂණාවරණයක්.

15. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මෙහි ඈ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ලියාපදිංචි ගාස්තුව ගෙවනු ලැබූවිට මෙම නියෝගවල ඉ උපලේඛනයේ සඳහන් "ඈ" ආකෘතියට සාරානුකූල ලියාපදිංචි සහතිකයක් මෙම නියෝග යටතේ වන යම් විනෝදජනක ක්‍රීඩා සඳහා වන මසුන් ඇල්ලීමේ යාත්‍රාවක් සඳහා නිකුත් කළ යුතු ය.

16. එකී ලියාපදිංචි සහතිකයේ වලංගු කාලසීමාව එම සහතිකය නිකුත් කළ දින සිට එක් වර්ෂයක කාලසීමාවක් සඳහා විය යුතු ය.

17. එකී යම් ලියාපදිංචි කිරීමක් අලුත් කිරීම සඳහා වන යම් ඉල්ලීමක් එකී ලියාපදිංචි සහතිකයේ කාලය ඉකුත්වීමේ දිනට එක් මසකට පෙරාතුව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

### *මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා පිළිබඳ දත්ත වාර්තා කිරීම*

18. යම් බලපත්‍රලාභී යාත්‍රාවක සෑම හිමිකරුවකු විසින් ම අල්ලා ගත් මත්ස්‍ය විශේෂ පිළිබඳ විස්තර මෙහි ඉ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ආකෘති අනුව ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සෑම කාර්තුවකට වරක් ඉදිරිපත් කළ යුතු ය.

19. යම් බලපත්‍රලාභී යාත්‍රාවක සෑම හිමිකරුවකු විසින් ම දත්ත වාර්තා කිරීම සඳහා මේ නියෝගවල ඉ උපලේඛනයේ විධිවිධාන සලසා ඇති ආකෘතියට අනුකූලව අල්ලාගත් සියලු මත්ස්‍ය විශේෂ මුදා හැරීම හා අල්ලාගත් සියලු මත්ස්‍ය විශේෂ ගොඩබෑම පිළිබඳ විස්තර වෙන වෙනම ලබාදිය යුතු ය.

20. මේ නියෝගවලː-

"බලයලත් නිලධරයා" යන්නෙන්, මේ පනතේ 46 (1) වන වගන්තිය යටතේ ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද යම් නිලධරයකු අදහස් වන අතර, සාජන්ට්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් යුධ හමුදා, ගුවන් හමුදා හෝ පොලිස් නිලධරයකු ද සුළු නිලධරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන යම් නාවික හමුදා නිලධරයකු ද ඊට ඇතුළත් වේ;

"ජීවිතාරක්ෂක උපකරණ" යන්නෙන්, මුහුදේ දී ඇතිවන අසීරු අවස්ථාවකදී ජීවිත ගලවා ගැනීමට උපකාරි වන උපකරණ අදහස් වේ.

"තහනම් කරනු ලැබූ මත්ස්‍ය විශේෂ" යන්නෙන්, 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සහ (469 වන අධිකාරය වූ) වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ තහනම් කරනු ලැබූ මත්ස්‍ය විශේෂ ලෙස සඳහන්ව ඇති යම් මත්ස්‍ය විශේෂයක් අදහස් වේ;

ක්‍රීඩා පිණිස මසුන් ඇල්ලීම, බිලීබෑම, මසුන් ඇල්ලීමේ ක්‍රීඩා "මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා" යනුවෙන් ද හඳුන්වනු ලබන යන්නෙන්, වාණිජ නොවන කාර්ය සඳහා මසුන් යොදා ගැනීම අදහස් වේ. මෙයට කිමිදුම් ශිල්ප ක්‍රම මගින් ක්‍රීඩාවක් ලෙස හෝ විනෝදය සඳහා යොදා ගනු ලබන යම් මසුන් ඇල්ලීමේ කටයුත්තක් ඇතුළත් වේ.

"වෙරළ පාදක" යන්නෙන්, වෙරළ හෝ ගොඩබිම සිට හෝ එය පාදක කොට හෝ ක්‍රියාත්මක වීමක් අදහස් කෙරේ.

## අ උපලේඛනය

### *මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා නියමිත ධීවර මෙහෙයුම්*

1. අත්යොත් පන්නය භාවිතයෙන් සිදු කරන ධීවර මෙහෙයුම්.

2. පිත්ත සහ රෝදය භාවිතයෙන් සිදු කරන ධීවර මෙහෙයුම්:-

   (අ). පොපින් (Popping);

   (ආ). ජිගින් (Jigging);

   (ඇ). ෆ්ලයි ෆිෂින් (Flyfishing);

   (ඈ). සජීවී ඇම, අජීවී ඇම (කවාකාර බිලීකොක්කක් සහිතව පමණි);

   (ඉ). ට්‍රෝලර් - දුවන පන්නය භාවිතයෙන් සිදුකරන ධීවර මෙහෙයුම්;

   (ඊ). විසි කිරීම් පන්නය (කාස්ටින්);

3. කිමිදීම

## ආ උපලේඛනය

### *මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා වන බලපත්‍ර ගාස්තුව/බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව*

| කාණ්ඩය | ගාස්තු (රු.)<br>(එක් වසරක් සඳහා) |
|---|---|
| 01. ශ්‍රී ලාංකික | |
| (අ) තනි පුද්ගල | 1,000 |
| (ආ) සමාගම් | 1,000<br>(එක් තැනැත්තකු සඳහා) |
| 02. විදේශික | |
| (අ) තනි පුද්ගල (සංචාරක වීසා දරන්නන්) | එක් දිනක් සඳහා 500 |
| (ආ) තනි පුද්ගල (නේවාසික වීසා දරන්නන්) | 5,000 |
| (ඇ) සමාගම් | (එක් තැනැත්තකු සඳහා)<br>6,000 |

ඇ උපලේඛනය

*යාත්‍රා ලියාපදිංචි කිරීමේ ගාස්තු*

| යාත්‍රා වර්ගය | ශ්‍රී ලාංකිකයන් සඳහා (රු.) |
|---|---|
| NTRB | 500 |
| MTRB | 500 |
| OFRP | 2,000 |
| එක් දින යාත්‍රා | 1,500 |
| එක් දින බහු දින යාත්‍රා | 5,000 |
| යොට් (yatch) | 5,000 |

ඈ උපලේඛනය

*යාත්‍රා නියමුවන් සඳහා නියමිත පුහුණු පාඨමාලා*

1. 2014 අංක 31 දරන ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා සාගර විශ්ව විද්‍යාලය.
2. 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ උපාධි පිරිනැමීමේ ආයතනයක් වශයෙන් පිළිගත් කොළඹ ජාත්‍යන්තර නාවික සහ ඉංජිනේරු විද්‍යාලය (CINEC).
3. වෙනත් යම් පිළිගත් පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන පිළිගත් වෙනත් යම් පුහුණු පාඨමාලාවක් (පාඨමාලා මොඩියුලය ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය).

ඉ උපලේඛනය

*කාර්තුමය වශයෙන් අල්ලාගත් මසුන් පිළිබඳ දත්ත වාර්තා කිරීමේ ආකෘතිය*

සාමාන්‍ය තොරතුරු

1. පුද්ගල නාමය/විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ ව්‍යාපාර නාමයඃ
2. සමාගම් ලියාපදිංචි අංකය (අදාළ වන්නේ නම්)ඃ
3. විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ ලියාපදිංචි අංකයඃ
4. ඇමතුම් අංකයඃ
5. යාත්‍රා ලියාපදිංචි අංකයඃ

| | |
|---|---|
| වාර්තාකිරීමේ කාලසීමාව | |
| මසුන් ඇල්ලීමේ ගමන් වාර ගණන | |
| මසුන් ඇල්ලීමේ ගමන් වාරයක උපරිම කාලය | |
| මසුන් ඇල්ලීමේ ගමන් වාරයක අවම කාලය | |
| මසුන් ඇල්ලීමේ ප්‍රදේශය | |

මත්ස්‍ය විශේෂඃ

අල්ලා ගනු ලැබ මුදා හල ප්‍රමාණය (කි. ග්‍රෑ)

| මත්ස්‍ය වර්ගය | ප්‍රමාණය (කි. ග්‍රෑ) |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |

| මත්ස්‍ය වර්ගය | ප්‍රමාණය (කි. ග්‍රෑ) |
|---|---|
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |
| 11. | |
| 12. | |
| 13. | |
| 14. | |
| 15. | |
| 16. | |
| 17. | |
| 18. | |
| 19. | |
| 20. | |
| 21. | |
| 22. | |
| 23. | |
| 24. | |
| 25. | |
| 26. | |
| 27. | |
| 28. | |
| 29. | |
| 30. | |
| 31. | |
| 32. | |
| 33. | |
| 34. | |
| 35. | |
| 36. | |
| 37. | |
| 38. | |
| 39. | |
| 40. | |
| 41. | |
| 42. | |
| 43. | |
| 44. | |
| 45. | |
| 46. | |
| 47. | |
| 48. | |
| 49. | |
| 50. | |

(ලැයිස්තුවට අමතරව) අල්ලන ලද අනෙකුත් මත්ස්‍ය විශේෂ

අල්ලා ගනු ලැබ ගොඩබාන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.)

| මත්ස්‍ය වර්ගය | ප්‍රමාණය (කි. ග්‍රෑ) |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |
| 11. | |
| 12. | |
| 13. | |
| 14. | |
| 15. | |
| 16. | |
| 17. | |
| 18. | |
| 19. | |
| 20. | |
| 21. | |
| 22. | |
| 23. | |
| 24. | |
| 25. | |
| 26. | |
| 27. | |
| 28. | |
| 29. | |
| 30. | |
| 31. | |
| 32. | |
| 33. | |
| 34. | |
| 35. | |
| 36. | |
| 37. | |

| මත්ස්‍ය වර්ගය | ප්‍රමාණය (කි. ග්‍රෑ) |
|---|---|
| 38. | |
| 39. | |
| 40. | |
| 41. | |
| 42. | |
| 43. | |
| 44. | |
| 45. | |
| 46. | |
| 47. | |
| 48. | |
| 49. | |
| 50. | |

මත්ස්‍ය විශේෂ ලැයිස්තුව ඊට අදාළ අනු අංක

| මත්ස්‍ය විශේෂය | අනු අංකය | මත්ස්‍ය විශේෂය | අනු අංකය |
|---|---|---|---|
| සප්පරා | 1. | Great Amberjack | 25. |
| කළු කොප්පරා | 2. | Almaco Jack | 26. |
| නිල් කොප්පරා | 3. | ලේන පරාවා | 27. |
| නිල් කොප්පරා | 4. | Blue Runner | 28. |
| තලපත් | 5. | ගල්ගුන්ඩා | 29. |
| Spearfish | 6. | වෙනත් මෝර මත්ස්‍යයින් | 30. |
| කහ වරල් කෙලවල්ලා | 7. | මඩුවා | 31. |
| තෝර ඇටවල්ලා | 8. | තෝර | 32. |
| බලයා | 9. | ජීලාව | 33. |
| ඇටවල්ලා | 10. | වන්නා | 34. |
| අලගොඩුවා | 11. | සාවරා | 35. |
| බයිටා | 12. | Cobia | 36. |
| අටනගුල් පරාවා | 13. | කොස්සා | 37. |
| Bluefin Trevally | 14. | රන්නා | 38. |
| කබර පරාවා | 15. | Treadfin Salmon | 39. |
| Gold Spot Trevally | 16. | මෝදා | 40. |
| ඉගුරු පරාවා | 17. | Oxeye Trapon | 41. |
| ගුරුල් පරාවා | 18. | Lady fish/Giant Herring | 42. |
| Horse eye Trevally | 19. | Featherback | 43. |
| Black Trevally | 20. | Snakehead/loola/Araganga & | 43. |
| වටියා | 21. | Mahseer/Leala & | 45. |

| මත්ස්‍ය විශේෂය | අනු අංකය | මත්ස්‍ය විශේෂය | අනු අංකය |
|---|---|---|---|
| කණ්ණඩි පරාවා | 22. | Catla | 46. |
| Giant Queenfish | 23. | | |
| Needleskin Queen fish | 24. | | |

**'අ' ආකෘති පත්‍රය** (9 වන නියෝගය)

| බලපත්‍ර අංකය- |
|---|

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

***මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා මෙහෙයුම් බලපත්‍ර ලබා ගැනීමේ අයදුම්පත***

1. අයදුම්කරුගේ/සමාගමේ විස්තර

| | | |
|---|---|---|
| අ. | අයදුම්කරුගේ/සමාගමේ නම | |
| ආ. | ලිපිනය | |
| ඇ. | ජා. හැ. අ. /ගමන් බලපත්‍ර අංකය | |
| ඈ. | ජාතිය | |
| ඉ. | තනි පුද්ගල/සමාගම් දුරකථන අංකය | |
| ඊ. | තනි පුද්ගල/සමාගම් ඊ මේල් ලිපිනය | |
| උ. | යාත්‍රා ලියාපදිංචි අංකය | |
| ඌ. | භාවිත කරන ධීවර මෙහෙයුම් ක්‍රම | |

ඉහත ඉදිරිපත් කළ දත්ත සහ තොරතුරු මාගේ දැනීම අනුව සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ වූ 2023 මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කළමනාකරණය නියෝගවල කොන්දේසි ප්‍රකාරව මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුතුවල නිරත වීමට මෙමඟින් එකඟ වෙමි.

................................ ...............................

හිමිකරුගේ අත්සන දිනය

කාර්යාලීය ප්‍රයෝජය සඳහා පමණි

ධීවර පරීක්ෂකගේ නිර්දේශය

මගේ අංකය :-
දිස්ත්‍රික් ධීවර කාර්යාල :-

අධ්‍යක්ෂ ජනරාල්,
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

මෙම අයදුම්පතෙහි සඳහන් බෝට්ටුව සඳහා මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා සඳහා වන බලපත්‍රය නිකුත් කිරීම සඳහා නිර්දේශ කරමි.

| ...................................... | .............................................. | .......................................... | ................................................ |
|---|---|---|---|
| ධී. ප නම | ධී. ප. අත්සන | ධී.ප. කොට්ඨාසය | දිනය |

සහකාර අධ්‍යක්ෂකගේ නිර්දේශය

දිස්ත්‍රික්කය :-

පසුපිටෙහි සඳහන් අයදුම්පත හා බැඳේ. ඒ අනුව :-

1. ලියාපදිංචි ගාස්තුව වශයෙන් රුපියල් .............................. මුදලක් ලැබුණු බවත් ඒ සඳහා අංක ...................... හා ....................... දිනැති කුවිතාන්සිය නිකුත් කර ඇති බවත්;

2. මාගේ දැනීම අනුව පසුපිටේ සඳහන් තොරතුරු නිවැරදි බවත්;

සහතික කරමි.

| ...................................... | .............................................. | .......................................... | ................................................ |
|---|---|---|---|
| ස. අ. නම | ස. අ. අත්සන | දිස්ත්‍රික්කය | දිනය |

**'ආ' ආකෘති පත්‍රය** (10 වන නියෝගය)

බලපත්‍ර අංකය-

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව**

***මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කටයුතු සඳහා ධීවර මෙහෙයුම් බලපත්‍රය***

......................... හි පදිංචි .................................................. මයා/මෙය/සමාගම වෙත 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ වූ 2023 මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා කළමනාකරණය කිරීමේ නියෝගවල විධිවිධාන ප්‍රකාරව මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩා මෙහෙයුම්වල යෙදීම සඳහා වන බලපත්‍රය මෙයින් ලබාදෙමි.

1. බලපත්‍රය නිකුත් කරනු ලබන යාත්‍රාවේ ලියාපදිංචි අංකය -
2. බලපත්‍රය යටතේ අවසර දී ඇති ධීවර මෙහෙයුම් -

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

.........................................................................................................................................................

3. බෝට්ටුව ගොඩබාන දිස්ත්‍රික්කය

කලින් අවලංගු කිරීමක් හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමක් සිදු කළහොත් මිස, මෙම බලපත්‍රය නිකුත් කළ දිනයේ සිට එක් වසරක කාලයක් සඳහා වලංගු වේ.

බලයලත් නිලධරයකු විසින් ඉල්ලා සිටින අවස්ථාවක දී බලපත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

| ...................................... | ...................................... |
|---|---|
| දිනය | අධ්‍යක්ෂ ජනරාල් |

**'ඇ' ආකෘති පත්‍රය** (14 වන නියෝගය)

***ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව***

මසුන් ඇල්ලීමේ විනෝදජනක ක්‍රීඩාවල නිරත ධීවර බෝට්ටුවක් ලියාපදිංචි කිරීම සඳහා වන අයදුම්පත්‍රය

1. හිමිකරුගේ/හිමිකරුවන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය

සම්පූර්ණ නම

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

...................................................................................................................................................

ජා. හැ. අ.

..........................................................................................................................................................................

සමාගමක් නම් ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය

..........................................................................................................................................................................

ලිපිනය

..........................................................................................................................................................................................

...................................................................................................................................................

විද්‍යුත් තැපැල් ලිපිනය

..........................................................................................................................................................................

වෙබ් අඩවිය

..........................................................................................................................................................................

2. ධීවර බෝට්ටුවේ විස්තර

| බෝට්ටු වර්ගය | කඳ සැකැස්ම | | | දිග | සාදන ලද වර්ෂය | යාත්‍රාංගන අංකය | නිෂ්පාදනය (දේශීය/ විදේශීය) |
|---|---|---|---|---|---|---|---|
| | දැව | ෆයිබර් FRP | ලෝහ | | | | |
| | | | | | | | |

3. ප්‍රචාලනය (Propulsion)

| හබල් | රුවල් | පිටත සවිකරන එනජිම සහිත | ඇතුළත සවිකරන එන්ජිම සහිත | ස්ටර්න් ඩ්‍රයිව් (Stern drive) | ජෙට් යානය (Jet) |
|---|---|---|---|---|---|
| | | | | | |

4. එන්ජිම පිළිබඳ විස්තරය

| | සැකැස්ම (make) | අනුක්‍රමික අංකය | අශ්ව බලය | ඉන්ධන වර්ගය |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |

5. බෝට්ටුවේ පහසුකම්

| | | | | |
|---|---|---|---|---|
| ආසන තිබීම | ඔව් | නැත | ඔව් නම්, ආසන සංඛ්‍යාව | |
| ස්ථිර වහල | | | තාවකාලික වහල | |
| යාත්‍රා කුටිය | | | ජීවිතාරක්ෂක කබා සංඛ්‍යාව | |
| ජී. පී. එස් | | | රේඩාර් | |
| SSB රේඩියෝ | | | මාලිමාව | |
| බිලීපිති රඳවනය | | | කිමිදුම් බෝතල් රඳවනය | |
| වෙනත් | | | | |

6. බෝට්ටුව නවත්වා තබන ස්ථානය

| ගොඩබාන ස්ථානයේ වර්ගය | | ස්ථානයේ නම | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික්ක කේතය |
|---|---|---|---|---|
| වරාය | | | | |
| නැංගුරම්පල | | | | |
| තොටුපළ | | | | |
| යාත්‍රාංගනය | | | | |

7. රක්ෂණ විස්තරය

| | |
|---|---|
| රක්ෂණ සහතිකයේ අංකය | |
| රක්ෂණ සමාගම | |
| රක්ෂණය කළ දිනය | |

ඉහත විස්තර කළ බෝට්ටුව මීට ප්‍රථම විනෝදය සඳහා මසුන් ඇල්ලීමේ බෝට්ටුවක් ලෙස ලියාපදිංචි කර නොමැති බවත් මා/අප විසින් ඉහත සඳහන් කර ඇති විස්තර සෑම අතින්ම සත්‍ය හා නිවැරදි බවත් මම/අපි බෝට්ටුවේ/බෝට්ටුවල සත්‍ය හිමිකරු/හිමිකරුවන් බවත් මෙයින් සහතික කරමි/කරමු.

.......................................................................................................
හිමිකරුගේ අත්සන

සාක්ෂිකරුගේ නම

.......................................................................................................

ලිපිනය

.......................................................................................................

ජාතික හැඳුනුම්පත් අංකය

.......................................................................................................

සාක්ෂිකරුගේ අත්සන

.......................................................................................................

කාර්යාලීය ප්‍රයෝජන සඳහා

සහකාර අධ්‍යක්ෂ
දිස්ත්‍රික්කය

පසුපිටේ සඳහන් අයදුම්පත් හා බැඳේ. ඒ අනුව,

1. ලියාපදිංචි ගාස්තුව වශයෙන් රුපියල් ................................ මුදලක් ලැබුණු බවත් ඒ සඳහා අංක .......................... හා ...................... දිනැති කුවිතාන්සිය නිකුත් කර ඇති බවත්,

2. මා විසින් ............................ දින ඉහත සඳහන් බෝට්ටුව සම්බන්ධව සිදුකළ පරීක්ෂණයෙන් පසු එය සෑම අතින් ම සම්පූර්ණ කර තිබූ බව සහ එය මුහුදු යෝග්‍යතාවයෙන් යුත් බව දැනගත් බවත්,

3. පසුපිටේ සඳහන් එන්ජිම/එන්ජින් අශ්ව බල ............................ ධාරිතාවකින් යුත් ............................ මාදිලියේ හා ........................... දරන එන්ජින් අංක/අංකයන්ගෙන් සමන්විත බවත්,

4. මාගේ දැනීමේ හැටියට පසුපිටේ සඳහන් තොරතුරු නිවැරදි බවත්

සහතික කරමි.

| ........................... | ............................ | ....................................... | .................................... |
|---|---|---|---|
| ධී. ප. නම | ධී. ප. අත්සන | ධී.ප. කොට්ඨාසය | දිනය |

මගේ අංකය :-
දිස්ත්‍රික් ධීවර කාර්යාලය :-

අධ්‍යක්ෂ ජනරාල් :-
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
කොළඹ 10

මෙම අයදුම්පතෙහි සඳහන් බෝට්ටුව ලියාපදිංචිය සඳහා නිර්දේශ කරමි/ලියාපදිංචි කර ඇත.

| ........................... | ............................ | ....................................... | .................................... |
|---|---|---|---|
| ස. අ. නම | ස. අ. අත්සන | දිස්ත්‍රික්කය | දිනය |

බෝට්ටුවේ වර්ගය

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සාම්ප්‍රදායික, මෝටර් සවි නොකළ බෝට්ටුව | NTRB | ඇතුළත සවි කළ එන්ජිම සහිත එක් දින බෝට්ටු | එක්දින (IDAY) | යොට් (yatch) | | |
| සාම්ප්‍රදායික, මෝටර් සවි කළ බෝට්ටුව | MTRB | පිටත සවි කළ එන්ජිම සහිත ෆයිබර් ග්ලාස් බෝට්ටු | OFRP | අක් වෙරළ බහු දින යාත්‍රාව | IMUL | |

**ආකෘති පත්‍ර 'ඇ'** (15 වන නියෝගය)

ලියාපදිංචි කිරීමේ සහතිකය

**ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව**

***ධීවර යාත්‍රාවක් ලියාපදිංචි කිරීමේ සහතිකය***

**I වන කොටස**

***ලියාපදිංචි කිරීමේ සහතිකය***

1. ලියාපදිංචි අංකය/බෝට්ටුවේ නම

2. පළමු ලියාපදිංචිය සිදු කළ දිනය

3. ධීවර යාත්‍රාවේ විස්තරයඃ-

   (අ). යාත්‍රා කඳ සැකසීම සඳහා යොදා ගත් අමුද්‍රව්‍ය;

   (ආ). යාත්‍රාව සාදන ලද දිනය;

   (ඇ). යාත්‍රා වර්ගය;

   (ඈ). යාත්‍රාවේ දිග සහ පළල;

   (ඉ). යාත්‍රාව යාත්‍රා කරන්නේ කෙසේද (හබල්, රුවල්, යන්ත්‍රානුසාරයෙන්);

   (ඊ). මෝටර් සවිකර ඇත්නම්ඃ-

      i. එන්ජින් අංකය;

      ii. වර්ගය;

      iii. අශ්ව බල ධාරිතාව;

      iv. භාවිත කරනු ලබන ඉන්ධන.

   (උ). ප්‍රතිෂ්ඨාපනය සහ ඉඩකඩ (ගැනියන් සංඛ්‍යාව)

4. යාත්‍රාංගන අංකය

5. ධීවර උපකරණ

6. යාත්‍රාවරණ සහ සන්නිවේදන උපකරණ

.............................................

අධ්‍යක්ෂ ජනරාල්
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දිනය ඃ- ...................................................

**II** වන කොටස

*අයිතිකරු පිළිබඳ විස්තර*

1. අයිතිකරුගේ සම්පූර්ණ නම
2. ජා. හැ. අංකය
3. ලිපිනය
4. අයිතිකරුගේ සම්පූර්ණ නම
5. ජා. හැ. අංකය
6. ලිපිනය
7. රක්ෂණ සහතිකයේ අංකය හා රක්ෂණය කරන ලද දිනය
8. සාමාන්‍යයෙන් යාත්‍රාව නවතා තබන ස්ථානය

..............................
දිනය

........................................
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**III** අ වන කොටස

*යාත්‍රාව පිළිබඳ සංශෝධිත විස්තර*

(එන්ජිමක් ආදේශ කළ විට හෝ යාන්ත්‍රික නොවන යාත්‍රාවක් යාන්ත්‍රික කළ විට)

| වර්ගය | අනු අංකය | අශ්ව බලය | භාවිත කරන ඉන්ධන | සවිකළ දිනය | පිටසන |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

**III** ආ වන කොටස

*යාත්‍රාව පිළිබඳ සංශෝධිත විස්තර*

(අනිකුත් සංශෝධන - උපකරණ, මාන, නම ආදිය වෙනස්වීම)

| සංශෝධනය | දිනය | පිටසන |
|---|---|---|
| | | |
| | | |
| | | |

**IV** වන කොටස

*යාත්‍රාව පැවරීම*

පළමුවැනි පැවරීම

1. අයිතිකරුගේ සම්පූර්ණ නම
   ජා. හැ. අංකය
   ලිපිනය
   අයිතිකරුගේ සම්පූර්ණ නම
   ජා. හැ. අංකය
   ලිපිනය
2. සාමාන්‍යයෙන් යාත්‍රාව නවතා තබන ස්ථානය
3. පැවරීමේ දිනය

..............................
දිනය

.........................................
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

දෙවැනි පැවරීම

1. අයිතිකරුගේ සම්පූර්ණ නම
   ජා. හැ. අංකය
   ලිපිනය
   අයිතිකරුගේ සම්පූර්ණ නම
   ජා. හැ. අංකය
   ලිපිනය
2. සාමාන්‍යයෙන් යාත්‍රාව නවතා තබන ස්ථානය
3. පැවරීමේ දිනය

..............................
දිනය

.........................................
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර සහ ජලජ සම්පත් දෙපාර්තමේන්තුව

**V** වන කොටස

*වාර්ෂික අලුත් කිරීම*

| වර්ෂය | ගෙවන ලද මුදල (රු.) | රිසිට්පත් අංකය | දිනය | පිටසන |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

EOG 02 - 0137

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.